# එදා සහ අද

පුනරින් ජයගත් රණවිරුවන්ට අපේ ප්‍රණාමය හිමිවෙයි. අද කෙසේ වුවත් එදා 1993 නොවැම්බර් මස 11 වැනි දින පුනරින් ලංකාණ්ඩුවේ හමුදාවන්ට අහිමි විය. ඉන් කියැවෙන්නේ ලංකා රාජ්‍යයට පුනරින් අහිමි වූ බව නොව කඳවුර අහිමි වීම ය. උතුරෙ පේදුරුතුඩුවේ සිට දකුණේ දෙවුන්දර තුඩුව දක්වා රාජ්‍ය සේවකයන්ට පඩි නඩි ගෙවනු ලැබුවේ ලංකාණ්ඩුව විසිනි. අප මතක තබාගත යුතු කරුණක් නම් ලංකාවේ කිසි දිනෙක කොටි විසින් පාලනය කරනු ලැබූ ප්‍රදේශයක් නොතිබූ බව ය.

කෙසේ වුවත් එදා අද මෙන් නොව දිහින් දිගට ම හමුදා මෙහෙයුම් කළ යුතු යැයි කීවෝ විරල වූහ. අද දෙමළ ජාතික සංධානයේ මන්ත්‍රීවරුන් හැරුණු විට හමුදා මෙහෙයුම් නතරකළ යුතු යැයි කීමට හෝ එයට සමච්චල් කිරීමට හෝ ඉදිරිපත්වන්නේ එ ජා පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනකු පමණ ය. එහෙත් අද හමුදා මෙහෙයුම් දිගට ම කළ යුතු යැයි කීමට ඒ සඳහා උද්ඝෝෂණය කිරීමට පෙළපාලි යෑමට ලංකාවට බලපෑම් නොකරන ලෙස ඉන්දියාවට කීමට ඉදිරිපත්වන්නෝ බොහෝ දෙනෙක් එදා හමුදා මෙහෙයුම්වලට විරුද්ධ වූහ. එහෙත් එදා ද අපි ජාතිවාදී යුදවාදී නින්දා අපහාස ලබමින් දරුවන් ද ඒ සියල්ලන්ගේ නිග්‍රහයට ලක්කරමින් හමුදා මෙහෙයුම් වෙනුවෙන් පෙනී සිටියෙමු.

අප විසින් 1993 නොවැම්බර් මස 24 වැනි දින, එනම් අදින් වසර පහළොවකට පෙර දිවයින පුවත්පතට ලියන ලද ලිපියකින් උපුටා දක්වන්නේ එදා අප කළ අරගලය යම්තමින් හෝ මතක් කළ යුතු බැවිනි. ජාතිය විකුණාගෙන කෑමට බලාපොරොත්තුවන ඇතැම් ජඩමාධ්‍යවේදීන්ට (ජඩමාධ්‍යවේදියෝ ජාතික මතවාද අතර ද සැඟවෙති.) අනුව ජනතාව සිටින්නේ අපට වඩා බොහෝ ඈතින් ය. එහෙත් අපට ඈතින් සිටින්නෝ ජනතාවට වඩා ජඩමාධ්‍යවේදීහු ය. අද ඔවුන් එදා අප කී දේ ම කීම පිළිබඳ ව අපට ඇත්තේ සතුටක් පමණ ය. 1993 දී ද අප දැරූ මතයට (අප ඒ මතය සකස් කර දශක දෙකකට වඩා කල් ගත වී ඇත.) අද බොහෝ දේශපාලන පක්ෂ හා සංවිධාන පැමිණ ඇති බව අප නිරීක්ෂණය කරන්නේ හද බැඳි සතුටින් ය. එකළ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වය දැරීම සඳහා ඇතැමුන් විසින් ආනනය කරනු ලැබ තිබූ බව ද අප ඇගේ දේශපාලනයට පැහැදිලි විරුද්ධත්වයක් දැක්වූ බව ද මෙහි ලා සඳහන් කරන්නේ මහින්ද රාජපක්ෂ මහතාගෙන් තෑගි බෝග ලබාගැනීමට නොවේ. අදින් වසර පහළොවකට පෙර අපි මෙසේ කීවෙමු.

“පුනරින්හි දී සිදුවුයේ කුමක් ද යන්න පිළිබඳ ව අටුවා ටීකා අවශ්‍ය නො වේ. ඕනෑවට එපාවට කරගෙන යනු ලබන මෙහෙයුම්වලින් දෙමළ ජාතිවාදයේ ත්‍රස්තවාදය පරාජය කළ නො හැකි ය. අද උතුරේ සැලසුම් සහගත මෙහෙයුමක් තිබේ ද යන්න ද ප්‍රශ්නයකි. එම මෙහෙයුම්වලට කිසිම දේශපාලන නායකත්වයක් නො මැති ය. මෙම තත්වය හේතුකොටගෙන භටයෝ අරමුණක් නො මැති ව මියයති. පුනරින් හි දී හමුදා භටයන් දැක්වූ නිර්භීත භාවය හා කැපවීම පිළිබඳ ජාතියේ ආචාරය ඔවුන්ට හිමි වේ. මියගිය හා විපතට පත් සෙබළුන් වෙනුවෙන් මුළු ජාතිය ම ශෝකවන බව ඔසවන ලද සුදු කොඩිවලින් පැහැදිලි ය. ජනතාව එසේ ශෝකවන අතර සංගීත සන්දර්ශන පැවැත්වූ ඇමතියන් ද නොසිටියේ නො වේ.

මෙම අවස්ථාවෙහි දී නොයෙකුත් දේශපාලන දර්ශන විසඳුම් ඉදිරිපත් කරනු දැකිය හැකි ය. ව්‍යාකූල වී ඇති ජාතික මතය තමන්ට අවශ්‍ය තැනකට ගෙන යා හැකි යැයි ජාතියේ සතුරන් වූ කුමන්ත්‍රණකාරයෝ සිතති. අද කළ යුත්තේ කුමක් ද? ප්‍රහාරය දැඩි කර ඉදිරියට ගොස් ත්‍රස්තවාදය මුල් කර ගත් දෙමළ ජාතිවාදය පරාජය කිරීම ද? නැතහොත් ආපසු හමුදා කැඳවා කොටි සංවිධානයට උතුරු පළාත භාරදීම ද? එසේත් නැතහොත් සමහරුන් කියන අයුරින් දේශපාලන විසඳුමක් දී දෙමළ ජනතාව නම්මාගෙන ඉන් පසුව කොටි සංවිධානය පරාජය කිරීම ද? .. .. .. .. දෙමළ පක්ෂ කිසිම ඓතිහාසික සාධක නොමැති ව ඉල්ලන අවම ඉල්ලීම් ගැන සාකච්ඡා කළ නොහැකි යැයි පවසන විට කළ යුත්තේ කුමක් ද?

ලංකාවේ සිංහල ජාතිකත්වය නැසීමට ලෝක අධිරාජ්‍යවාදය විසින් දෙමළ ජාතිවාදය යොදා ගැනේ. දෙමළ ජාතිවාදය සහ දෙමළ සුළු ජාතිය යන්න ඇතිකරන ලද්දේ ලෝක අධිරාජ්‍යවාදයේ පුරෝගාමී ජාතික අධිරාජ්‍යවාදීන් වූ බ්‍රිතාන්‍යයන්

© Prof. Nalin De Silva

විසිනි. දෙමළ ජාතිවාදය යුක්තියුක්ත කිරීම ද සිදුවන්නේ ලෝක අධිරාජ්‍යවාදයේ මෙහෙයවීමෙනි. ප්‍රශ්නයෙහි සියළු වරද සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් හා භික්ෂූන් වහන්සේ මත පටවන ලිපිලේඛන පොත්පත් නිතර පළවේ. මහාචාර්ය තම්බයියා විසින් ලියන ලද බුඩිසම් බිට්‍රේඩ් යන්න ඉන් එකක් පමණකි. එහි වැදගත්කම ඇත්තේ එය පළකරන ලද ආයතනය ජාත්‍යන්තර ආයතනයක් වීම හා කුමන්ත්‍රණය හෙළිදරව්වීම හේතුකොටගෙන ය.. .. .. ..

සිංහල බෞද්ධකම නැසීමට දේශපාලනයෙහි දී ප්‍රභාකරන් හා පොන්නම්බලම් යොදාගැනෙන්නේ නම් ශාස්ත්‍රීය අංශවල දී නොයෙකුත් බුද්ධිමත්තු යොදාගැනෙති. මෙම බුද්ධිමතුන් අතර ඊනියා සිංහලයෝ ද වෙති. ගුවන් විදුලිය, රූපවාහිනිය, අධ්‍යාපනය ආදිය සංස්කෘතික අංශයෙහි සිංහල ජාතිකත්වය නැසීමට යොදා ගැනෙයි. .. .. .. ආර්ථික ක්ෂේත්‍රයෙහි දී ආර්ථික විද්‍යාඥයන්, පාසල්, විශ්වවිද්‍යාල යොදාගනිමින් ජනතාවගේ ආකල්ප වෙනස්කිරීම් ආදිය සිංහල ජාතිකත්වය නැතිකිරීමේ අවි වේ.

මෙයින් පැහැදිලි වනුයේ ප්‍රභාකරන් යනු මෙම ජාත්‍යන්තර කුමන්ත්‍රණයෙහි වැදගත් එහෙත් එක් අංගයක් පමණක් බව ය. සිංහල ජාතිකත්වය නැසීමේ මෙම කුමන්ත්‍රණය ලංකාවෙහි තදින් ම ක්‍රියාත්මක වීමට පටන්ගත්තේ 1956න් පසුව ය. සිංහල බෞද්ධයන් තම නැති වී ගිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන්කිරීම අධිරාජ්‍යවාදය නොඉවසූ දෙයක් විය. 1962 සිදුවූයේ ජාතික වශයෙන් ක්‍රියාත්මක වූ හමුදා පොලිස් කුමන්ත්‍රණයකි. එය ඉතා ගොරහැඩි එකක් විය. 1962ට පසුව ඔවුහු ඉතා සියුම් ව ක්‍රියා කරති .. .. ..

ඒ සියල්ල සමග මෑතක සිට තවත් අංශයක් ක්‍රියාත්මක වනු අපට දැකිය හැකි ය. ඒ ශ්‍රී ල නි පක්ෂයෙහි ප්‍රතිපත්ති වෙනස් කිරීම ය. ශ්‍රී ල නි ප යනු සිංහල මහ සභාවෙහි අනුප්‍රාප්තික සංවිධානයයි. එය අධිරාජ්‍ය ගැති නොවන ජාතික පක්ෂයක් ලෙස බිහිවිය. එහි ආර්ථික ප්‍රතිපත්ති මාක්ස්වාදී නොවුණ ද ධනවාදී ද නො වී ය. එහෙත් අද එම පක්ෂයට සිදු වී ඇත්තේ කුමක් ද? අද එය ධනපති ක්‍රමය හා විවෘත ආර්ථිකය පිළිගනියි. එහි බලය දිනාගෙන ඇති කණ්ඩායමට අද ජාතිකත්වයක් ද නැත. පළාත් සභාවලට කලින් විරුද්ධ වූ එම පක්ෂය අද පළාත් සභාවලට තවත් බලය ඉල්ලා සටන් කරයි. මෙය මතුපිටින් ආණ්ඩු විරෝධි වූවක් ලෙස පෙනී ගිය ද එහි අරමුණ වනුයේ දෙමළ ජාතිවාදයට තව තවත් බලය ලබා දීම ය. (එකල එ ජා ප ආණ්ඩුවක් විය)

බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව ඔසී අබේගුණසේකර මහතා ඉදිරිපත්කර ඇය පරාජය කළ අය අද ශ්‍රී ල නි පක්ෂයට සහයෝගය දක්වන්නේ කුමක් නිසා දැයි සිතාගත හැකි ය. ඔවුන්ට අවශ්‍ය වන්නේ සිංහල ජාතියේ අයිතිය පාවාදෙන දේශපාලන විසඳුමක් ශ්‍රී ල නි ප ලවා ක්‍රියාත්මක කරවීමට ය. අනුර බණ්ඩාරනායක මහතා පක්ෂයේ සිටින තුරු බණ්ඩාරනායක මැතිණිය ජනාධිපති අපේක්ෂිකාව වීම පිළිබඳ ව ප්‍රශ්නයක් නොනැගුවෝ දැන් එය ද ප්‍රශ්න කරති. . .. .. ශ්‍රී ල නි පක්ෂයෙහි ජාතිකත්වය රැකගැනීමට බණ්ඩාරනායක මහත්මිය පෙරට පැමිණ කුමන්ත්‍රණකරුවන් පරාජය කර ජාතික බලවේගයට නායකත්වය දිය යුතු ය. එසේ නොමැතිව තොන්ඩමන් මහතා සමග එකතු වී පළාත්සභා බලය ඇල්ලීමට උත්සාහ කිරීම තාවකාලික ව පක්ෂයට ජයග්‍රහණයක් ගෙන දුන්න ද දිගු කාලීනව ගත්කල සිංහල ජාතියේ මිනීවල කැපීමකි. හමුදා මෙහෙයුම් පිළිබඳ ව අද ජනතාව තුළ ඇත්තේ ප්‍රසාදයක් නො වේ. මෙය දිනීමට නොහැකි සටනක් ය යන අදහස ඇතිකර ඊනියා දේශපාලන විසඳුම පිළිගැන්වීමට ඇතැම් දේශපාලන න්‍යායාචාර්යන්ට අවශ්‍ය වෙයි. මේ අතර කෙළවරක් නැති ලෙස සටන දිග්ගැස්සීමෙන් අත මිට සරුකර ගන්නෝ ද වෙති. සමහරු මේ දෙකොටසට ම අයත් වෙති. .. ..

කොටි ත්‍රස්තවාදය හමුදා ක්ෂේත්‍රයෙහිත් දෙමළ ජාතිවාදය එහි දී මෙන් ම දේශපාලන හා න්‍යායාත්මක තලවලත් පරාජය කිරීම අවශ්‍ය වේ. ඒ සමග ම ජාත්‍යන්තර කුමන්ත්‍රණය ද පරාජය කළ යුතු වේ. කොටි ත්‍රස්තවාදය පරාජය කළහැකි බව රණවිරු කොබ්බෑකඩුව මහතා පෙන්වා දී ඇත. එයට අවශ්‍යවන්නේ හමුදා නායකත්වයේ හා දේශපාලන නායකත්වයේ කැපවීම ය. .. .. ගුවන්විදුලිය රූපවාහිනිය හා අනෙකුත් ජනමාධ්‍ය යොදාගනිමින් රට යුද මානසිකත්වයක තබා ජනතාව ද සහභාගි කරවා ගනිමින් හමුදා මෙහෙයවිය යුතු ය. ”

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva